වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 20 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 17 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ වශයෙන් 2015 වර්ෂයේ අවසානය දක්වා වන කාල පරිච්ඡේදයට අනුකූලව රු. 4,894,174 ක් ගෙවිය යුතුව තිබුණද, ගෙවිය යුතු මුදලක් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. එම හේතුවෙන් සමුච්චිත අරමුදල මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පළාත් පාලන නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම ප්‍රතිලාභ වශයෙන් 2016 වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු. 31,498 ක මුදල ආදායම් වියදම් ගිණුමට ගෙනවිත් නොතිබීමෙන් ආදායම් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්
--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 49,960 ක ගෙවියයුතු මුදල අදාල පුද්ගලයාට ගෙවා නොතිබුණි.

(ආ) රු. 37,176 ක ලොතරැයි සඳහා වූ තැන්පත් මුදල් ආපසු ගෙවා නොතිබුණි.

1.3.4 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
-----------------------------------------------

සභාව විසින් මිණුම් ලේඛනය ,දේපල විකුනුම් බදු ලේඛනය, විදුලි සම්බන්ධතා ලේඛනය යනාදී ලේඛන පවත්වා නොතිබුණි.

1.3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) | මුදල් රෙගුලාසි 381(3) | චෙක්පත්වල අත්සන් කිරීම සඳහා බලය පවරන ලද නිලධාරින් ඇප මුදල් ගෙවා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | 2011 සිට 2012 දක්වාවූ වර්ෂ 02 ක් ඉක්මවූ රු. 18,000 ක් වටිනා ටෙන්ඩර් තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 1646 | අදාල මාසයේ වාහනවල ධාවන සටහන් ඊලඟ මාසයේ 15 වන දිනට ප්‍රථම විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 45,367,037 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 39,106,488 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 6,260,549 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු 1,661 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 5,455 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රතිඵලය රු. 3,794 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 230,413,646 ක් වී තිබූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 194,260,862 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 36,152,784 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,570 | 1,698 | 5,296 |
| බදු කුලී | 8,908 | 8,827 | 290 |
| බලපත්‍ර ගාස්තු | 3,737 | 2,543 | 3 |
| වෙනත් ආදායම් | 85,924 | 86,963 | 128,060 |
| එකතුව | 100,139 | 100,031 | 133,649 |

2.4.2 වරිපනම් බදු

වරිපනම් බදු නැවත තක්සේරු කර නොතිබුණි. තවද, රු. 4,942,970 ක් මෙතෙක් අයකර නොතිබුණි.

2.4.3 බදු සහ කුලි

රු. 275,508 ක හිඟ බදු අයකර ගෙන නොතිබුණි.

2.4.4 වෙනත් ආදායම්

සුසානභූමි 13 කින් සුසානභූමි බදු අයකර නොතිබුණි.

2.4.5 මුද්දර ගාස්තු

මුද්දර ගාස්තු රු. 98,104,520 ක් ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් අයකරගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 136 ක්වූවද තත්‍ය සේවක සංඛ්‍යාව 110 කි ඒ අනුව පුරප්පාඩු 27 ක් සහ අතිරික්ත සේවක සංඛ්‍යාව 01 ක් ද විය.

3.2 ඌන උපයෝජිත වත්කම්

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු. 880,625 ක් වටිනා සති පොල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) සභාවට අයත් බවුසර් 02 ක් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයේ තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

රු. 70,238,400 ක් වටිනා වැඩ 30 ක් සඳහා අයවැය ලේඛනයෙන් මුදල් වෙන්කර තිබුණද, වැඩ ආරම්භ කර නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

අයවැය පාලනය

-----------------

වියදම් ව්‍යුහය

---------------

අයවැය ගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 05 සිට රු. 23,800,312 දක්වා වියදම් විචලනයක් පැවතුනුබව විගණනයේදී නිරීක්ෂණය විය.